Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**උපදේශක (නැටුම්/සංගීත) තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පවතින පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|
| (i) | උපදේශක (නැටුම්) | 01 |
| (ii) | උපදේශක (සංගීත) | 01 |

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ අයදුම්පත් **2021.09.10** දින හෝ ඊට පෙර ලැබෙන සේ ''අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "උපදේශක (නැටුම්/සංගීත)" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය.

02. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :

(i) කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කෙරේ.
(ii) වැටුප රු.35,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(i) *අධ්‍යාපන සුදුසුකම්* :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලබාගත් සෞන්දර්ය උපාධිය ;

හා

ජාතික නැටුම්/සංගීත අවසාන විභාගය සමත්වීම හෝ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ විශාරද විභාගය සමත්වීම.

(ii) වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

(යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.)

(iii) *පළපුරුද්ද*.- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
(ලිඛිතව සනාථ කළ හැකි වසර 10ට වැඩි පළපුරුද්ද සඳහා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දේ).

(iv) *කායික සුදුසුකම්* :
(i) සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(ii) උස අඩි 5 යි අඟල් 3 කට නො අඩු විය යුතුය.

(v) *වෙනත් සුදුසුකම්* :

(i) සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ii) තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 60ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

*යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>● නර්තන/සංගීත විෂයය සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 10<br>● උපාධියට අමතරව නර්තන/සංගීත විෂයය සම්බන්ධ අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම - ලකුණු 05 | 15 | අදාළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද<br>● වසර 15ට වැඩි - ලකුණු 25<br>● වසර 10 - 15 දක්වා - ලකුණු 20<br>● වසර 10 - ලකුණු 15 | 25 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>● දේශීය තලයේ ස්වතන්ත්‍ර නර්තන/සංගීත නිර්මාණ ඉදිරිපත් කර තිබීම - ලකුණු 05<br>● ජාත්‍යන්තර තලයේ ස්වතන්ත්‍ර නර්තන/සංගීත නිර්මාණ ඉදිරිපත් කර තිබීම - ලකුණු 05<br>● පාරම්පරික නර්තන/සංගීත ශිල්පියකු වීම - ලකුණු 05<br>● නර්තන/සංගීත ආචාර්යවරයකු ලෙස පළපුරුද්ද - ලකුණු 10 (වසර 05ට වැඩිවන සෑම වසරක් සඳහාම ලකුණු 01 බැගින්)<br>● නිර්මාණකරනයේ පළපුරුද්ද - ලකුණු 10 (වසරකට ලකුණු 01 බැගින්) | 35 | |
| 4. භාෂා ප්‍රවීණතාවය<br>● රජය විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් ඉංග්‍රීසි භාෂා පිළිබඳ පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 10 | |
| **එකතුව** | 100 | |

06. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

අයදුම්පත්‍ර පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු අතර, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. තනතුරු ලබාගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

08. අයදුම්පතෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

09. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

තරණි අනෝජා ගමගේ,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2021 අගෝස්තු මස 13 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

### ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :

| |
|---|
| |

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ උපදේශක (නැටුම්/සංගීත) (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. උපන් දිනය :————.
04. වයස (2021.09.10 දිනට) : අවුරුදු ............ මාස ............ දින ............
05. උස : අඩි ............ අඟල් ............
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී / පුරුෂ භාවය :————.
08. ලිපිනය :————.
09. දුරකථන අංකය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

(i) ලබාගත් උපාධිය :.......................................

| *වලංගු වන දිනය* | *ක්ෂේත්‍රය* | *ආයතනය/විශ්ව විද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |

(ii) ජාතික නැටුම්/සංගීත අවසාන විභාගය/භාත් ඛණ්ඩේ විද්‍යා පීඨයේ විශාරද විභාගය :

| *වලංගු වන දිනය* | *සමත් විභාගය* | *ආයතනය/විශ්වවිද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. පළපුරුද්ද :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.